**පරිශුද්ධ දේවමාතාවන්** | **දේව ප්‍රකාශන** | 01-01-2015

**මරියෝත්තමාවන්ගේ මංගලෝත්සවය**

**පළමුවන දේව ප්‍රකාශනය** ගණන්කථාව 6:22-27

ගණන් කථාවෙන් උපුටා ගත් කොටසකි.

**ඔවුන්මාගේ නාමය කියා අයදින විට මම ද ඔවුන්ට ආසිරි වස්වමි.**

සමිඳාණන්වහන්සේ මෝසෙස්ට කතාකොට මෙසේ වදාල සේක. "ආරොන් සහ ඔහුගේ පුත්‍රයන් අමතා, 'නුඹලා ඉශ්රායෙල් ජනයාට ආශිර්වාද කරන විට මෙලෙස කිව යුතු වේ.සමිඳාණෝ ඔබට ආශිර්වාද කොට ඔබආරක්ෂා කරන සේක්වා!

සමිඳාණෝ ඔබ දෙස දයාවෙන් බලා ඔබට කරුණා කරන සේක්වා! සමිඳාණෝ සිය නෙත් ඔබ කෙරෙහි යොමා ඔබට සමාදානය දෙන සේක්වා!

"ඔවුන් ඉශ්රායෙල් ජනයා වෙනුවෙන් මාගේ නාමය කියා අයදිනවා ඇත. එවිට මමද ඔවුන්ට ආසිරි වස්වමි."

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**පිළිතුරු ගීය** ගීතාවලිය 67:1-7

ඔබගේ පිළිතුර: **දෙවිඳාණෝ අප වෙත දයාව පාමින් කරුණා කරන සේක්වා!**

ගීය: දෙවිඳාණෝ අප වෙත දයාව පාමින් කරුණාව පෙන්වන සේක්වා! එවිට මුළු ලොව ඔබේ කැමැත්ත දැන ගන්නේ ය. සිය¨ විජාතීහු ඔබේ ගැළවීමේ බලය දැනගන්නෝ ය.

අහෝ දෙවිඳුනි, ජනතාවෝ ඔබ පසසත්වා. සියළු ජාතීහු ඔබ පසසත්වා! ඔබ සාධාරණ ලෙස මිනිසුන් විනිශ්චය කරන සේක. මිහිපිට විජාතීන් හට ඔබ මග පෙන්වන සේක. බැවින් සකලජනයා ප්‍රීතිමත් ව සතුටින් ගී ගයත්වා!

අහෝ දෙවිඳුනි. ජනතාවෝ ඔබ පසසත්වා. සිය¨ ජාතීහු ඔබ පසසත්වා. පොළොව පලදාව බහුලව නිපදවිය. දෙවිඳාණෝ, අපේ දෙවිඳාණෝ, අපට ආසිරි දුන් සේක. අපේ දෙවිඳාණෝ අපට ආසිරි වස්වන සේක් වා! පොළෝ වැසි සියල්ලෝ එතුමන්ට ගරු කරත් වා!

**දෙවන දේව ප්‍රකාශනය** ගලාති 4:4-7

ශුද්ධවූ පාවුළු තුමන් විසින් ගලාතිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**දෙවියන් වහන්සේ ස්ත්‍රීය ගෙන් උපත ලත්**
**සිය පුත්‍රයාණන් එවා වදාළ සේක.**

එහෙත් කාලය සම්පූර්ණ වූ කල දෙවියන් වහන්සේ ස්ත්‍රීය ගෙන් උපත ලත් ව්‍යවස්ථාව යටතේ උපන් සිය පුත්‍රයාණන් එවා වදාළ සේක. එසේ කළේ අප පුත්‍රකම ලබනු වස් උන්වහන්සේ විසින් ව්‍යවස්ථාව යටතෙහි සිටි අය මුදාගන්නා පිණිස ය. තවද ඔබ පුත්‍රයන් බව ඔප්පු කරන පිණිස, "අබ්බා, පියාණෙනී, " කියා

හඬගසන තම පුත්‍රයාණන්ගේ ආත්මය දෙවියන් වහන්සේ අප සිත් වලට එවා වදාළ සේක. මෙසේ ඔබ තවදුරටත් දාසයෙක් නොව පුත්‍රයෙකි. පුත්‍රයෙක් නම් දේව වරමින් උරුමක්කාරයෙකි.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සුපුවත් ජය නද** හෙබ්‍රෙව් 1:1-2

ආලේලූයා! ආලේලූයා!

දෙවියන් වහන්සේ ආදී යුගවල දී නොයෙක් විට ද
විවිධාකාරයෙන් ද දිවැසිවරුන් මගින්
අපේ පියවරුන්ට කතා කළ සේක.
එහෙත් දැන් මේ අවසාන කාලයේ දී
උන්වහන්සේ සිය පුත්‍රයාණන් මගින් අපට කතා කළ සේක.

ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** ලූක් 2:15-21

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**අට දවස පිරුණු කල බිළිඳා හට ජේසුස් යන නාමය තබන ලද්දේය.**

තවද, දේව දූතයන් ඔවුන් කෙරෙන් සගලොවට ගිය කළ එඬේරු "අපි වහාම බෙත්ලෙහෙමට ගොස් ස්වාමින් වහන්සේ අපට දන්වා වදාළ මේ සිද්ධිය බලමු" යි ඔවුනොවුන් අතර කතා කර ගත්හ. ඔව්හු යුහුව ගොස් මරියා තුමිද ජෝසෙප්ද ගව ඔරුවක සතප්වා උන් බිළිඳා ද දුටුවෝය. ඔවුහු ඒ දැක මේ දරුවා ගැන තමන්ට දන්වන ලද දේ පළ කළහ. ඒ ඇසූ සියල්ලෝ, එඬේරුන් පැවසූ සියල්ල ගැන මවිත වූහ. එහෙත් මරියතුමී එකී සියල්ල සිත්හි නිදන් කොට ඒවා මෙනෙහි කළාය. එඬේරුද තමන්ට දන්වන ලද ලෙසම ඇසූ දුටු සියල්ල ගැන දෙවියන් වහන්සේට ගෞරව කරමින්ද ප්‍රශංසා කරමින්ද පෙරළා ගියහ. උන්වහන්සේගේ චර්මඡේදන පිළිවෙත සඳහා අටදවස පිරුණු කල, උන්වහන්සේ කුසෙහි පිළිසිඳ ගැනීමට පෙර දේව දූතයා විසින් දෙන ලද,'ජේසුස්"යන නාමය උන්වහන්සේට තබන ලද්දේය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.